# මහජනතාව වෙත
# කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර තැන්පතු රැස්කිරීම

## මාලන් ෆර්නැන්ඩෝ ඉන්ටර්නැෂනල් ෆොරෙක්ස් එක්ස්චේන්ජ් යුනිට් (පීවීටී) එල්ටීඩී (PV 00231295) සහ කුරුකුලසූරිය ෆර්මි මාලන් ෆර්නැන්ඩෝ (871263574V)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025.11.06 දින;

(i) 26 වන මහළ, නැගෙනහිර කුළුණ, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ ලියාපදිංචි මාලන් ෆර්නැන්ඩෝ ඉන්ටර්නැෂනල් ෆොරෙක්ස් එක්ස්චේන්ජ් යුනිට් (පීවීටී) එල්ටීඩී (MARLON FERNANDO INTERNATIONAL FOREX EXCHANGE UNIT (PVT) LTD) (PV 00231295) යන සමාගම; සහ

(ii) අංක 07, ආනන්ද පාර, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ ලිපිනයෙහි පදිංචි කුරුකුලසූරිය ෆර්මි මාලන් ෆර්නැන්ඩෝ (871263574V) යන අය;

විසින් උක්ත පනතෙහි 2 (2) වගන්තිය උල්ලංඝනය කරමින් තැන්පතු භාරගත් බවට නිශ්චය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතෙහි 42 (10) වන වගන්තිය යටතේ මහජන සුභසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ඉහතින් සඳහන් කරන ලද සමාගමට සහ පුද්ගලයාට;

(i) පොරොන්දු පත්‍ර නිකුත් කිරීම මඟින් හෝ වෙනත් කිසිදු ආකාරයකින්, මහජනතාවගෙන් තැන්පතු භාර නොගන්නා ලෙස; සහ

(ii) එම සමාගම සහ පුද්ගලයා සතුව පවතින සියලු තැන්පතු වගකීම් පියවීමට පියවර ගත යුතු බවට

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් විධාන කර ඇත.


**ශ්‍රී ලංකා මහ බැංකුව**

**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

☎ 011-2477504 011-2477738 @ dsnbfi@cbsl.lk http://www.cbsl.gov.lk